**SINHALA**


Ministero dell’istruzione, dell’università e della ricerca
Istituto Comprensivo Statale “Don Lorenzo Milani”
Via Monte Bisbino, 12 - 20900 MONZA MB
Tel. 039.735350 - Fax 039.2720792
C.F.94581270157
Codice univoco: UFNH2B
e-mail: mbic8ae002@istruzione.it /e-mail: mbic8ae002@pec.istruzione.it
sito: www.donmilanimonza.edu.it


# සමවගකීම සහිත අධ්‍යාපනික ගිවිසුමේ "COVID-19" සඳහා වූ උපග්‍රන්ථය

SARS-CoV-2 පැතිර යාම වැළැක්වීමේ සහ එය තවදුරටත් බෝවීම වැළැක්වීමේ ක්‍රියාවලියට අනුකූලව සහISS COVID වාර්තාවට අනුව පාසල් 58 ක් විසින් 2020/8/21 දින පාසල් මගින් අනුගමනය කල යුතු අරක්ෂිත විධි විධාන ඇතුළත් පහත සඳහන් ක්‍රියාමාර්ග පාසලේ දැනට පවතින සමවගකීම සහිත අධ්‍යාපනික ගිවිසුමට ඇතුළත් කරන ලදි.

**පාසල වශයෙන් කැපවන්නේ:**

- ආයතනික වශයෙන් පාසල සතු සම්පත් සහ නිපුණතා අනුව, දැනට පවතින රෙගුලාසි අනුව සහ නිසි බලධාරීන්ගේ මග පෙන්වීම යටතේ කල හැකි මැදිහත්වීම් ඉටු කිරීම

  පාසලේ සියලුම ස්ථාන ආරක්ෂිත මෙන්ම සෞඛ්‍යාරක්ෂිත බව රැක ගැනිමට සහ ඒ සඳහා අවශ්‍යය උපකරණ සහ ද්‍රව්‍ය පාසලට හැකි පමණින් සැපයිමට සහතික වීම. මෙතෙක් නිසි බලධාරීන් විසින් අපේක්ෂිත ලෙස නැවත ආරක්ෂාකාරී ලෙස අධ්‍යාපනය ලබා දීමට සහතික වීම සහ ඩිජිටල් ඉගැන්වීම්ද ඒකාබද්ධ කිරීම

- ඩිජිටල් ඉගැන්වීම්ද ඒකාබද්ධ කිරීම පිළිබඳ සැලැස්ම වැඩි දියුණු කිරීම හෝ තුන් අවුරුදු පාඨමාලාවට (PTOF) එය අඩංගු කරගත හැකි ක්‍රමවේදයන් සලකා බැලීමටත් ඩිජිටල් ඉගැන්වීම්ද ඒකාබද්ධ (DDI) නැවත සැලසුම් කලයුතු නම් ඒ පිළිබඳව සහ එහි අන්තර්ගතය නියමිත වේලාවට දෙමව්පියන් දැනුවත් කිරීමට වගවීම (DDI මාර්ගෝපදේශ 2020 ජූනි 26 දින අංක 39 දරණ අධ්‍යාපන අමාත්‍යංශ නියෝගය )
- ඉගෙනීමට යොදා ගන්නා පරිසරය සෞඛ්‍යය සම්පන්න සහ මානසික සුභසාධනය වර්ධනය වන පරිදි සංවිධානය කිරීමට වගවීම
- Covid-19 ආසාදනය වැළැක්වීමට කාර්යය මණ්ඩලය පුහුණු කිරීම සහ සමස්ත පාසල් පද්ධතියම ආවරණය වන පරිදි එය සංවිධානය කිරීම
- පාසල් කාර්යය මණ්ඩලය ඩිජිටල් තාක්ෂණය පිළිබඳව පුහුණු කිරීමටත් යාවත්කාලින නිරීමටත් භාර ගන්නා අතර එමගින් සිසු දරුවන්ගේ ඉගෙනීමේ ක්‍රමවේද වඩාත් ශක්තිමත් කිරීමට යම්කිසි හදිසි සනීපාරක්ෂක තත්ත්වයන් යටතේ

උපයෝගි කර ගැනීම

- කුඩා සිසු දරුවාගේ සිට සියලුම සිසු දරුවන්ට ඩිජිටල් ඉගැන්වීම් සංවර්ධනය සඳහා මුල පිරීමට භාර ගැනීම සහ හැකි ලෙස අපහසුතා සහිත පවුල් වලටද තොරතුරු තාක්ෂණයට ප්‍රවේශ වීමට පවතින ගැටලු (පවුල් ආර්ථික) අවම කිරීම
- නිසි බලධාරීන් විසින් පනවා ඇති නීති සහ තහංචි නිසියාකාරව පිළිපදිනවාද යන්න අධීක්ෂණය කිරීම
- හදිසි සනීපාරක්ෂක තත්ත්වයන් යටතේ ඇති වී තිබෙන කම්පන සහගත  සහ ආතතිය වැනි තත්ත්වයන් සඳහා පවතින සීමිත සම්පත් උපයෝගි කර ගනිමින් ගුරුවරුන්ට, සිසු දරුවන්ට සහ ඔවුන්ගේ පවුල් වලට මනෝ අධ්‍යාපනික සහයෝගය ලබා දීමට ඉදිරිපත් වීම

**පවුල් සංස්ථාව කැප වන්නේ:**

- පාසලේ සියලුම කටයුතු ආරක්ෂාකාරී ලෙස පවත්වාගෙව යාම සඳහා ලබාදී ඇති මග පෙන්වීම් බෙදා හදා ගනිමින් එයාකාරයෙන් පවත්වාගෙව යාමට දායක වීම
- SARS-CoV-2  ව්‍යාප්තිය පාලනයටත් ඉන් ආරක්ෂා වීමට ගත හැකිග්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් වීමටත්”අප ආයතනය මගින් පල කර ඇති තොරතුරු හොඳින් කියවා දැන ගැනීමත් ඊට අදාලව පාසල මගින් ගන්නා ලබන  ක්‍රියාමාර්ග පිළිබඳව නිරන්තරයෙන් දැනුවත් වීම
- දිනපතා ඔබේ දරුවාගේ සහ පවුලේ අනෙක් සාමාජිකයන්ගේ සෞඛ්‍යය තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ SARS-CoV-2 අදාළ රෝග ලක්ෂණ පහල වී ඇත්නම් (පසුගිය දින 3 තුළ)දරුවා නිවසේ නතර කරගත යුතු වන අතර වහාම දරුවාගේ වෛද්‍යවරයා දැනුවත් කර සෞඛ්‍යය බලධාරීන් ලබාදෙන උපදෙස් අනුව කටයුතු කිරීම
- ඔබේ දරුවා නියම කෙරුණු ලෙස නිරෝධායනය හෝ නිවසේ හුදෙකලා වීම නියමාකාරයෙන් සිදු කිරීම
- යම් හෙයකින් ඔබ දැනුවත්ව පසුගිය දින 14 තුළ SARS-CoV-2 ආසාදිතයෙක් ළඟින් ඇසුරු කලේ නම් ඒ පිළිබඳව පවුලේ/දරුවාගේ වෛද්‍යවරයාගෙන් විමසා ඊට අදාළ ලෙස ක්‍රියා කරන්න *(cfr. Documento del Comitato tecnico scientifico c/o il Dipartimento della Protezione Civile-Presidenza del Consiglio dei Ministri del 23/06/2020 – Prot. N. CTS 630- 2020/0036225)*
- පාසලේදී දරුවාට Covid-19 රෝග ලක්ෂණ පහල වුවහොත් වහාම පැමිණ දරුවා රැගෙන යා යුතු වන අතර දරුවා පාසලේ ගත කරනා කාළය තුළ පවුලේ කෙනෙක් හෝ ඔබ නියෝජිතයෙක් සූදානමින් සිටීම
- රෝග ලක්ෂණ සහිත දරුවා පවුලේ වෛද්‍යවරයා හෝ දරුවාගේ වෛද්‍යවරයා වෙත යොමු කරන්න
- දරුවාට පහළ වී ඇත්තේ Covid-19 රෝග ලක්ෂණ යැයි සැක කෙරේ නම් වෛද්‍යවරයා ලබාදෙන උපදෙස් පිළිපැදීම
- නැවත පාසලට පැමිණීමේදී වෛද්‍යවරයා ලබාදුන් උපදෙස් පිළිපැදි බව ප්‍රකාශ කිරීම
- දරුවා පාසලට නොපැමිණි විට විද්‍යුත් ලේඛණයේ ( Registro elettronico) හෝ ළදරු පාසල් සඳහා  අනෙක් ක්‍රම මගින් පහත සඳහන් හේතුන් වලින් එකක් දක්වන්න

- Motivi personali o di famiglia  (පවුලේ හෝ පෞද්ගලික හේතුන් මත)

- Motivi di salute NON riconducibili all’infezione da Covid (කොවිඩ් නොවන සෞඛ්‍යය හේතුන් මත)

- Dichiaro di aver consultato il medico/pediatra per sintomi potenzialmente sospetti per l’infezione da Covid e che questo non ha ritenuto di effettuare accertamenti specifici per indagare l’evntuale positività da Covid-19 (මතු වූ රෝග ලක්ෂණ අනුව කොවිඩ් නොවන බව පවුලේ/දරුවාගේ වෛද්‍යවරයා නිගමනය කළ බැවින් Covid-19 සඳහා වැඩි දුර පරීක්ෂණ අනවශ්‍යය බව පැවසු බව ප්‍රකාශ කර සිටීම්)

- වෛරසය පැතිරයාම වැළකීමට සහ පාලනයට අවශ්‍යය පියවර අනුගමනය සඳහා දරුවා තුළ මනා ස්වයං පාලනයක් මෙන්ම වගකීම් සහගතභාවය වර්ධනය වන ආකාරයට කටයුතු කිරීම
- දරුවාට පාසලේදි මෙන්ම ඉන් පිටතදීත් ප්‍රවේශම් වීමේ අවශ්‍යතාවය ගැන අවබෝධය ලබා දෙන්න
- පාසලට ඇතුල්වීමේ සහ පිටවීමේ ක්‍රමාවේදයන්ට ගරු කිරීමටත් වේළාවට පාසලට එවීමටත් වගබලා ගැනිම
- පාසල තුළ ඉගැන්වීම් අත්හිටුවීමට සිදු වුවහොත් ඒකාබද්ධ ඩිජිටල් ඉගැන්වීම් (Didattica Digitale Integrata)සක්‍රිය කිරීමෙන් ගුරුවරුන් සමග සහයෝගයෙන් කටයුතු කරමින් ඩිජිටල් තාක්ෂණය ඔස්සේ දරුවාව නිතිපතා ඉගෙනීමට යොමු කිරීම

**තම වයසට අනුව දරුවා/දැරිවිය සහ ශිෂ්‍යයා/ශිෂ්‍යාව කැප වන්නේ:**

- SARS-CoV-2 පැතිරයාම වැළැක්වීමටත් එය පාලනයටත් පාසල් කාර්යය මණ්ඩලය හා ගුරුවරු දී ඇති සරල නීති අවබෝධයෙන් තේරුම් ගෙන ඒවා නිතරම අනුගමනය කිරීම
- වෛරසය පාලනයට සහ පැතිරයාම අඩු කිරීමට පාසල මගින් ගෙන ඇති පියවර පාසලේ සියලුම සිසුන් වෙනුවෙන් නිරන්තරයෙන් ගරු කරමින් අනුගමනය කිරීම
- පාසල් වේළාව තුළ Covid-19ට අදාළ රෝග ලක්ෂණ ඇති වුවහොත් වහාම ගුරුවරු දැනුවත් කළ යුත්තේ එවිට වහාම ආරක්ෂිත ක්‍රමවේදය අනුගමනයටත් තවත් බොහෝ දෙනෙකුට බෝවීම වැළැක්වීමටත්ය
- සියලු දෙනාටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිවාසිකමට ගරු කරමින් ආයතනයේ නීති රීති වලට අනුව පවත්නා හදිසි සෞඛ්‍යය හේතුන් මත පාසල තුළදි මෙන්ම දුරස්ථව ඩිජිටල් තාක්ෂණය ඔස්සෙ සම්බන්ධ වීමේදිද සියලුම ගුරුවරු,පාසල් කාර්යය මණ්ඩලය සහ අනිකුත් සිසු දරුවන් සමග සක්‍රියව සහ වගකීම් සහගත ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම
- ඒකාබද්ධ ඩිජිටල් ඉගැන්වීම් ක්‍රියාත්මක කිරීමට සිදු වුවහොත් දුරස්ථව ඉගැන්වීම් වලට සහභාගි වීමේදි පාසලේ නීති රීති පරිදි නිවැරදිව හැසිරීමට වගබලා ගැනීම.

| Dirigente/Docente delegato | දෙමව්පිය අත්සන | ශිෂ්‍යයා/පංතිය/පාසල |
| --- | --- | --- |
| ______________________ | ________________ | ___________________ |